# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.26 පැය 1225 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 148 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද සිගරට් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුර.**

2025.01.25 වන දින දහවල් කාලයේ උප්පුවේලි පොලිස් වසමේ මුරුගපුර ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර විදේශීය රටක සිට **තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද සිගරට් 180ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන උප්පුවේලි පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 56 ක් වන ඕසර්හිල්, ත්‍රිකුණාමලය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

උප්පුවේලි පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුර.**

2025.01.25 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් යාපනය පොලිස් වසමේ ස්ටැන්ලි පාර ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලි ග්‍රෑම් 500ක්, හෙරොයින් ග්‍රෑම් 04 මිලිග්‍රෑම් 120ක් හා ජංගම දුරකතනයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන යාපනය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36ක් වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

යාපනය පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 03. හෙරොයින් සමඟ සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා උතුර පළාත් විශේෂ වැටලීම් ඒකකය.

2025.01.25 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා උතුරු පළාත් විශේෂ වැටලීම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මන්නාරම පොලිස් වසමේ උප්පුකුලම ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර හෙරොයින් ග්‍රෑම් 98 ක් සමඟ සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට ගෙන මන්නාරම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 50 ක් වන මාලිගාවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වන අතර සැකකාරිය වයස අවුරුදු 54ක් වන ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මන්නාරම පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 04. පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කළ සැකකරුවන් සිව් දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරලගංවිල කඳවුර.

2025.01.25 වන දින අළුයම් කාලයේ වැලිකන්ද පොලිස් වසමේ බොරවැව ප්‍රදේශයේදී **පුරාවස්තු ලබාගැනීමේ අරමුණින් පිරිසක් කැණීම් කරමින් සිටින බවට** පොලිස් විශේෂ කාර්ය බලකා අරලගංවිල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **කැණීම් කරමින් සිටි සැකකරුවන් සිව්දෙනෙකු කැණීම් සඳහා යොදාගත් උපකරණ ද සමඟ** අත්අඩංගුවට ගෙන වැලිකන්ද පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 20 ත් 50 ත් අතර වයස්වල පසුවන දෙහිඅත්තකණ්ඩිය,සෙවනපිටිය හා කාශ්‍යප පුර ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

වැලිකන්ද පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 05. තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද සිගරට් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා නීග්‍රෝධාරාම උප ඒකකය.

2025.01.25 වන දින දහවල් කාලයේ බද්දේගම පොලිස් වසමේ අම්පේගම ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා නීග්‍රෝධාරාම උප ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර විදේශීය රටක සිට **තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද සිගරට් 200ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන බද්දේගම පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 75 ක් වන අම්පේගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බද්දේගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 06. ගංජා හේන් 02ක් වටලා සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කතරගම කඳවුර.

2025.01.25 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කතරගම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරු මත තණමල්විල පොලිස් වසමේ වැටහිරකන්ද රක්ෂිත ප්‍රදේශයේදී අක්කර ½ ක පමණ භූමියක වගා කර තිබූ ගංජා ගස් 25000ක් සමග සැකකරුවෙකු හා අක්කර ¼ ක පමණ භූමියක වගා

කර තිබූ ගංජා ගස් 15000ක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන තණමල්විල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 37 හා 41 යන වයස්වල පසුවන තණමල්විල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

තණමල්විල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**